# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1603 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 19/10/2024 පැය 1750

### නවීකරණය කරන ලද ළමා හා කාන්තා කාර්යාංශ විවෘත කිරීම

ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශය මඟින් ළමුන්ට හා කාන්තාවන්ට සිදුවන වැරදි සම්බන්ධයෙන් පැමිණිලි භාර ගැනීම හා විමර්ශන සිදු කිරීම සිදුකරනු ලබයි. එසේ පැමිණිලි යොමු කිරීමට පැමිණෙන ළමුන් හා කාන්තාවන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි දිවයිනේ පොලිස් ස්ථානවල ළමා හා කාන්තා කාර්යංශ එකම ආකෘතියක් යටතේ නවීකරණය කිරීමට පියවර ගන්නා ලදී.

ඒ අනුව වව්නියාව කොට්ඨාසයේ ඕමන්ත පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කායීංශ ගොඩනැගිල්ල නවීකරණය කර විවෘත කිරීම **2024.10.19** වන අද දින වැඩබලන **පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානාත්වයෙන් සිදු කෙරිණි.**

පොලිස් ස්ථානයන්හි පිහිටා ඇති ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිලි වෙනම පිවිසුමක් සහිතව වෙන් වූ ස්ථානයක ස්ථාපිත කර ඇති අතර සියළුම පොලිස් ස්ථානවල පිහිටි ළමා කාන්තා කාර්යංශ පරිශ්‍රයන් තුළ භෞතික සම්පත් එකම ආකෘතියක් යටතේ ස්ථානගත කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම ළමා හා කාන්තා කාර්යංශ සඳහා අවශ්‍ය වන පරිදි නිලධරයන් අනුයුක්ත කිරීමටද පියවර ගෙන ඇත.

මෙලෙස නවීකරණය කරන ලද ළමා හා කාන්තා කාර්යංශ මඟින් කාන්තාවන්ගේ සහ ළමුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි විමර්ශන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබී ඇත. ළමුන් අනාරක්ෂිත වීම, ලිංගික හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය මෙන්ම ළමා මෙහෙකාර සේවයේ යෙදවීම වැනි දරුවන්ට හා කාන්තාවන්ට මුහුණු දීමට සිදු වන ඕනෑම ආකාරයේ අපරාධයකින් වින්දිතයින් බවට පත් වන දරුවන් හා කාන්තාවන් වෙනුවෙන් යුක්තිය ඉටු කරලමින් ඔවුන් සුරක්ෂිත කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා දිවයිනම ආවරණය වන පරිදි ළමා හා කාන්තා කාර්යංශ වල රාජකාරී නියුතු පොලිස් නිලධරයන් කටයුතු කරනු ලබයි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්


Active Kids











**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**